(769)
FACULTY OF GRADUATE STUDIES
RECEIVED
07 AUG 2012
UNIVERSITY OF KELANIYA
FACULTY OF GRADUATE STUDIES
RECEIVED
24 JAN 2011
UNIVERSITY OF KELANIYA

# බුත්සරණෙහි ක්‍රියාපද පිළිබඳ වාග්විද්‍යාත්මක විග්‍රහයක්

වී. ඒ. වීරවර්ධන



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 769 |
| වර්ග අංකය: | |



කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ වාග්විද්‍යාව පිළිබඳ දර්ශනපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2011 ජනවාරි

# සාර සංග්‍රහය

බුත්සරණ ග්‍රන්ථයේ ක්‍රියාපද පිළිබඳව විමර්ශනය කෙරෙන මෙම නිබන්ධයේ පරිච්ඡේද 8 කි. එහි අනුපිළිවෙළ මෙසේය.

1. ලිපි සංකේත විචාරය
2. ශබ්දිම වින්‍යාසය.
3. ක්‍රියාධාතු පදිම ශබ්දිම ගණවලට බෙදීම.
4. උපසර්ග යෝගය සහ නිපාත යෝගය.
5. ක්‍රියා ශබ්ද
6. ක්‍රියා වරනැගීම
7. උපකාරක ක්‍රියා සහ ප්‍රච්ඡන්න ක්‍රියා
8. ධාතුපාඨය

පළමු පරිච්ඡේදයේදී බුත්සරණෙහි යෙදෙන ක්‍රියා පදවල ලේඛන සංකේත පිළිබඳව වන රේඛීම විචාරයක් සිදුකෙරේ. ක්‍රියාපදවල ස්වර හා ව්‍යඤ්ජනයන්හි ලේඛන විකල්පන හඳුනාගැනීම, ලිපි සංකේතවල ශබ්දිමමය අගය විනිශ්චය කිරීම හා එම ශබ්දිම වර්ගීකරණය යන කරුණු මීට ඇතුළත් වෙයි.

ක්‍රියාධාතු නිරූපණයෙහි යෙදෙන ශබ්දිම දැක්වීම ශබ්දිම වින්‍යාසය හා ක්‍රියා ධාතු නිරූපණයෙහි ලා අදාළ ස්වර රටා සහ ව්‍යඤ්ජන රටා යන කරුණු දෙවන පරිච්ඡේදයෙන් විමසීමට ලක් කෙරේ.

තෙවන පරිච්ඡේදයේදී ක්‍රියා ධාතු පදිම ශබ්දිම ගණවලට විභාග කර දැක්වේ. වරනැගීම අනුව ක්‍රියාධාතු,

i. ක්‍රමික ධාතු
ii. විශේෂ ක්‍රියාධාතු හා
iii. ප්‍රච්ඡන්න ක්‍රියාධාතු වශයෙන් ද

සංස්ථිතිය අනුව,

i. සරලධාතු හා
ii. සංකීර්ණ ධාතු ලෙස ද මෙහිදී ක්‍රියා ධාතු හඳුනා ගැනේ.

සිව්වන පරිච්ඡේදයේදී ක්‍රියාරූප සාධනය සම්බන්ධව වන උපසර්ගයෝගය, උපසර්ගවල තන්ත්‍ර රූප, විශ්ලේෂණීය උපසර්ග, ක්‍රියා පද සමඟ සම්බන්ධිත නිපාත පද, ඒවා ක්‍රියා ව්‍යුත්පත්තියෙහි යෙදෙන අයුරු සහ ඒවායේ ස්වතන්ත්‍රතාව විමර්ශනයට ලක් කෙරෙයි. මෙහිදී බුත්සරණෙහි එම නිපාත සහ උපසර්ග යෙදී ඇති ස්ථාන පිළිබඳ වාර්තාවක් ද ඉදිරිපත් කෙරේ.

ක්‍රියාශබ්ද සාධනය පිළිබඳව කරුණු දැක්වෙන්නේ පස්වන පරිච්ඡේදයෙනි. ධාතුගණ බෙදීම, ක්‍රියා ශබ්ද හඳුනාගැනීම ප්‍රයෝජ්‍ය ක්‍රියා ශබ්දය, නිරුත්සාහක / කර්මකාරක ක්‍රියා ශබ්දය අනතීත සහ අතීත ක්‍රියා ශබ්ද පිළිබඳ විස්තර මීට ඇතුළත්ය.

ඉහත දැක්වූ ධාතුගණවලට අයත් ක්‍රියාපද සමාපක සහ අසමාපක වරනැගීම් සහ කෘදන්ත සාධනයට යොමුවන අයුරු සයවන පරිච්ඡේදයෙන් විග්‍රහයට ලක් කෙරේ.

එහි දළ සැලැස්ම පහත දැක්වේ.

i. වර්තමාන වරනැගීම.
ii. අතීත වරනැගීම.
iii. අනාගත වරනැගීම.
iv. විධික්‍රියාව.
v. ආශිර්වාද ක්‍රියාව.

} සමාපක ක්‍රියා

i. පූර්ව ක්‍රියා
ii. මිශ්‍ර ක්‍රියා
iii. අසම්භාව්‍ය ක්‍රියා

} අසමාපක ක්‍රියා

i. කෘදන්ත සාධනය

සත්වන පරිච්ඡේදය බුත්සරණෙහි යෙදෙන උපකාරක ක්‍රියා සහ ප්‍රච්ඡන්න ක්‍රියා පිළිබඳව විග්‍රහය සඳහා වෙන් වෙයි. එහි උපකාරක ක්‍රියා, ක්‍රියා සමාස සහ ප්‍රච්ඡන්න ක්‍රියා සහ ඒවායේ වරනැගුණ රූප පිළිබඳව කරුණු ඇතුළත්ය.

අටවන පරිච්ඡේදය යටතේ ක්‍රියාධාතු නාමාවලිය, ඒවායේ වරනැගුණ රූප, පිටු අංක හා පේළි අංක සහ ඒවායේ අයත් ව්‍යාකරණ ප්‍රවර්ග දක්වේ.

මධ්‍යකාලීන සිංහලයේ (8 - 13 සියවස් අතර) ක්‍රියා පද පිළිබඳ තොරතුරු රැසක් මීට ඇතුළත් වේ. මෙම පර්යේෂණය මඟින් හෙළිවන තොරතුරු සිංහල ක්‍රියාපදයේ සංස්ථිතිය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී මෙන්ම එහි ඉතිහාසය පිළිබඳව කරුණු සෙවීමේදී වාග්විද්‍යාඥයින්ට මෙන්ම සිසුන්ට ද ප්‍රයෝජනවත් වේ.